# යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)

## වැඩසටහන සඳහා

# ගොවීන්ගේ යොමුවීම

දිස්නා රත්නසිංහ, සමන්ත තුසිත කුමාර,
ඒ. එස්. එම්. රොෂාන්, මහේෂ් අත්තනායක
කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාව

චමිලා චන්ද්‍රසිරි
සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය







සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක ආහාර සඳහා ලොව පුරා පවතින ඉල්ලුම දිනෙන් දින වැඩිවෙමින් පවතී. මෙම පාරිභෝගික ඉල්ලුමට සරිලන අයුරින් ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම සෑම නිෂ්පාදකයකුගේම ප්‍රධාන වගකීමක් වී ඇත. එසේ වුවද අද වෙළඳපොලේ පවතින බොහෝ නැවුම් කෘෂි නිෂ්පාදන පරිභෝජනයට පාරිභෝගිකයා යම් මැලිකමක් දක්වන බව රහසක් නොවේ. එසේ නම් ගොවීන් විසින් නිෂ්පාදනය කර වෙළඳපොලට ඉදිරිපත් කරන ආහාරයේ (ගොවිපළ නිෂ්පාදනයේ) ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිත බව පාරිභෝගිකයාට තහවුරු කරන ක්‍රමවේදයක් එනම් ගොවිපළ නිෂ්පාදන සහතිකකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යාවශ්‍ය කරුණකි.

ඒ අනුව 2015 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරෝගාමිත්වයෙන් යහපත් කෘෂි පිළිවෙත් (GAP) වැඩසටහන ප්‍රථම වරට ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. යහපත් කෘෂි පිළිවෙත් (Good Agriculture Practices) යනු, ගොවිපලෙහි වැඩ කරන ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය හා සුභ සාධනය පිළිබඳව සැලකිලිමත් වෙමින් පරිසර හිතකාමී ලෙස ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීමේ ක්‍රමවේදයකි. යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහනකදී ගොවිපලේදී කෘෂි නිෂ්පාදන ආසාදනයට ලක්විය හැකි විවිධ ආකාරයන් සියල්ල හඳුනාගෙන, මුල සිටම

එම තත්ත්වයන් වළක්වා ගැනීමට පියවර ගනු ලැබේ. මෙහිදී යම් ගොවිපලක බෝග වගාවට ඉඩම් තෝරා ගැනීමේ සිට බෝග පිහිටුවීම, නඩත්තුව, අස්වනු නෙලීම සහ ඇසිරීම ආදී සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියම අධ්‍යයනය කර, එය යහපත් කෘෂි පිළිවෙත් අනුව සිදු වන බවට සහතික කර, යහපත් කෘෂි පිළිවෙත් (GAP) සහතිකය ලබාදේ.

යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2015 වර්ෂයේදී යුරෝපා සංගමය මගින් ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන එළවළු සහ පලතුරු සඳහා පනවා තිබූ තාවකාලික තහනම ඉවත් කර ගැනීමේ අරමුණෙනි. යුරෝපීය වෙළඳපොළ තව දුරටත් ආරක්ෂා කර ගනිමින් දේශීය වෙළඳපොල සහ දේශීය පාරිභෝගිකයා සඳහා ගුණාත්මක සහ සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනය කිරීම අද මෙම වැඩ සටහනේ ප්‍රමුඛතම අරමුණ වී ඇත. යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාවේ සම්බන්ධීකරණයෙන් දිවයින පුරා සියලුම අන්තර් පළාත්, පළාත් සභා සහ මහවැලි බල ප්‍රදේශවල ක්‍රියාත්මක කෙරේ. සහතිකකරණය සිදු කරනුයේ බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ සේවයට අයත් යහපත් කෘෂි පිළිවෙත් සහතිකකරණ ඒකකය මගිනි.

මෙම වැඩසටහන සඳහා යොමුවන ගොවීන් මුලින්ම ඒ සඳහා ලියාපදිංචි වීමට ප්‍රදේශයේ කෘෂි ව්‍යාපාර උපදේශන නිලධාරීන් හා කෘෂිකර්ම උපදේශක නිලධාරීන් හරහා අයදුම්පතක් යොමු කළ යුතුය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් මේ වන විට නැවුම් එළවළු සහ පලතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතිය SL-1523 වෙළුම 1 - 2016 ප්‍රකාශයට පත්කර ඇත. එම ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවය අනුව පිරික්සුම් ලැයිස්තුවක් සකස් කර ඇති අතර එම නිර්ණායකයන්ට අනුව අදාල ගොවිපල සකස් කළ යුතුය. යහපත් කෘෂි පිළිවෙත් අනුව ගොවිපල සැකසූ පසුව විගණන නිලධාරීන් විසින් එය පරීක්ෂා කර විගනනයෙන් සමත් වේ නම් යහපත් කෘෂි පිළිවෙත් සහතිකය ලබාදේ.

මෙම සමීක්ෂණය, යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා බලපාන ප්‍රධාන සාධක හඳුනාගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද අතර, මේ සඳහා GAP වැඩසටහන සඳහා ලියාපදිංචි වූ ගොවීන් 85 ක සාම්පලයක් තෝරාගන්නා ලදී.

යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වැඩසටහනට ගොවීන් යොමු වීමට බලපාන කරුණු, එනම් යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳව ඔවුන්ගේ දැනුම හා අවබෝධය, ආකල්ප, යහපත් කෘෂි පිළිවෙත් පිළිපැදීමට ඇති හැකියාව, සහ බාහිර සාධක වන නිෂ්පාදන වල මිල සහ වෙළඳපොළ අවස්ථා පිළිබඳව අධ්‍යයනයේදී විමසා බලන ලදී.

## යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳ ගොවීන්ගේ අවබෝධය සහ ඒ සඳහා යොමුවීම

යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන පිළිබඳ ගොවීන්ගේ අවබෝධය විමසා බැලීමේදී, ඔවුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් GAP යනු සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවන වැඩසටහනක් බව දැන සිටි නමුත් GAP ගොවිපලකදී පරිසරය ගැන සැළකිලිමත්වීම












හා ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය හා සුභ සාධනය ගැන සැලකිලිමත් විය යුතු බව දැන සිටියේ අඩු පිරිසකි. නමුත්, යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳව ගොවීන් තුළ ධනාත්මක ආකල්ප පැවතීම පැහැදිලි කරුණක් විය. යහපත් කෘෂි පිළිවෙත් සහතිකකරණයේදී මූලිකව සලකා බලන සාධක කිහිපයක් පිළිපැදීමට ගොවීන් යොමුවී ඇති දැයි සලකා බලන ලදී. එනම්,

- සුදුසු භූමියක් තෝරාගැනීම.
- පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම.
- නිර්දේශිත පරිදි රෝග පලිබෝධ පාලනය.
- නිර්දේශිත පරිදි පොහොර යෙදීම.
- පසු අස්වනු කටයුතු වලදී දක්වන සැලකිලිමත්භාවය.
- ගොවිපල වාර්තා තබාගැනීම.
- සේවක සෞඛ්‍යය හා සුභසාධනය ගැන සැලකිලිමත් භාවය.

මෙහිදී පැහැදිලි වූයේ අනිකුත් කටයුතු වලට සාපේක්ෂව පොහොර භාවිතය සහ සේවක සෞඛ්‍යය හා සුබසාධනය ගැන ගොවීන් අඩු සැළකිල්ලක් දක්වන බවයි.

## යහපත් කෘෂි පිළිවෙත් පිලිබඳව ගොවීන්ගේ දැනුම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට පරිබාහිරව, අනවශ්‍ය සහ අක්‍රමවත් ලෙස පළිබෝධනාශක සහ පොහොර භාවිතයට මෙන්ම බෝග නිෂ්පාදනයේදී සෞඛ්‍යාරක්ෂිත නොවන විවිධ ශෂ්‍ය ක්‍රියාවන් අනුගමනය කිරීමට සමහර ගොවීන් අද යොමුවී ඇත. මෙම තත්ත්වය

ගොවිපල නිෂ්පාදන පරිභෝජනය කරන පාරිභෝගිකයාගේ සහ නිෂ්පාදකයගේ ද සෞඛ්‍යයට තර්ජනයක් වනවා මෙන්ම පරිසරයට ද සිදුකරනුයේ විශාල හානියකි. GAP සහතිකය ලබා ගැනීම සඳහා මෙම සියලු ශෂ්‍ය ක්‍රියාවන් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශයන්ට අනුව සිදුකළ යුතු වේ.

අප විසින් සිදුකරන ලද සමීක්ෂණය සඳහා තෝරා ගත් ගොවීන්ගෙන් සැළකිය යුතු පිරිසක් GAP ගොවිපලකදී පිළිපැදිය යුතු ඒකාබද්ධ පලිබෝධ පාලන ක්‍රමවේද පිළිබඳව දැන සිටි අතර ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම තුනකට වඩා විස්තර කිරීමට සමත් විය. එසේම පළිබෝධනාශක භාවිතය සම්බන්ධව පෙර අස්වනු කාලය ගැන සමීක්ෂණයට ලක්කරන ලද ගොවීන්ගෙන් බහුතරයක් (74%) දැනුවත්ව සිටි අතර 26% කට මේ පිළිබඳව දැනුමක් නොවීය.

වැඩි පිරිසක් පොහොර නිර්දේශ භාවිතය පිලිබඳ දැන සිටියද නිර්දේශිත පරිදි පොහොර භාවිතයට යොමුව සිටියේ ඉන් කොටසක් පමණි. ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ ක්‍රමවේදය ගැන අවබෝධයක් තිබුනේ 56% තරම් අඩු පිරිසකට විය. පස පරික්ෂා කර අවශ්‍යතාවය අනුව පොහොර යෙදීම පිළිබඳව කිසිවෙකුත් සඳහන් කර නොතිබුණි.

## GAP සහතිකය ලබාගැනීම සඳහා සුදුසුකම් සපිරීම

GAP සහතිකකරණයේදී ගොවින් විසින් සම්පූර්ණ කළ යුතු නිර්ණායක 15 ක් තෝරාගෙන මෙම නිර්ණායක සම්පූර්ණ කර තිබූ ගොවින් සංඛ්‍යාව සලකන ලදී. මෙහිදී සලකන ලද ගොවින්ගෙන් වැඩි පිරිසක් ඉහත සලකන ලද නිර්ණායක වලින් 75% ට වඩා සම්පූර්ණ කර තිබූ බව පැහැදිළි විය.

## කෘෂි නිෂ්පාදන අලෙවිය පිළිබඳ අදහස

සලකන ලද ගොවින් කණ්ඩායම අතරින් වැඩි පිරිසකට (83%) නිෂ්පාදන අලෙවි කරගැනීමේ අලෙවි මාර්ග එකක් හෝ වැඩි ගණනකට යොමුව තිබූ අතර සියයට දහහතක් වැනි පිරිසකට නිෂ්පාදන අලෙවි කරගැනීමේ ක්‍රමයක් නොවීය. මෙම කණ්ඩායම අතරින් 54% වැනි පිරිසක් දැනට GAP සහතික ලත් කෘෂි නිෂ්පාදන වලට පවතින මිල පිළිබඳව සෑහීමට පත්වන අතර, 46% පවතින මිල පිළිබඳව සෑහීමට පත් නොවේ.

යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහනට සම්බන්ධ වීම සඳහා වාණිජ ගොවින් ලෙස ලියාපදිංචි වූ ගොවින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිලිබඳ යහපත් අදහසකින් සිටින බව සමීක්ෂණයෙන් පැහැදිලි විය. බෝග සඳහා පොහොර භාවිතය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රම, ගැන ඔවුන්ගේ දැනුම වැඩි කිරීම මෙන්ම සේවක සෞඛ්‍යය හා සුබසාධනය පිළිබඳව ඔවුන්ගේ සැළකිලිමත් භාවය ඉහළ නැංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුබව පැහැදිළි විය. එසේම ආර්ථිකමය දිරිගැන්වීම් (Economic Incentives), සහ හිතකර රාජ්‍ය ප්‍රතිපත්ති යහපත් කෘෂි පිළිවෙත් වැඩසටහන කෙරෙහි වැඩි ගොවින් පිරිසක් අනුවර්තනයට හේතු වනු ඇත.

*මෙම සමීක්ෂණය සඳහා සහයෝගය ලබාදුන් සියළුම කෘෂි ව්‍යාපාර උපදේශක නිලධාරීන් සහ තාක්ෂණ සහයක නිලධාරීන්ට ස්තූතිය පළ කරමු.*

# හුරුවෙමු අපි සිංහල හාලේ රස බත් පතට



මෙම ලක් පොළවෙහි ඉපදුන ලක්වැසි සැම දෙනට
කුස හුරු වී ඇත්තේ සිංහල හාලේ බතට
ඒලෙසම කොස්-දෙල්-කුරහන්-අල-බතලද අපට
ගුණ දෙන ආහර වෙයි සැම දෙන පිළිගත් ලෙසට

පෙර සිහලුන්ගේ දස්කම් විස්කම් විල සින්න
සිංහල හාලේ බත්වල ඇති සවි බල යෙන්න
රට තුළ සාගර පරදන මහවැව්ව සම ගින්න
අහස උසට ඉදිකළ දාගැබ් ඇත දැක ගන්න

සරු පොළවක් ජල සම්පත් ඇති මුත් අපෙ රටට
දත නියවන්නේ ඇයි අපි පිට රට නැව් වලට
හෙල ගොවියගේ දෑතේ සවියෙන් ලැබ දෙන අපට
හුරුවෙමු අපි සිංහල හාලේ රස බත් පතට

පොල්සම්බලයක්, කිරි හොද්දක් සැකසූ රසට
සමඟින් බත් වේලෙන් උදයේ ඔබගේ කුසට
ලැබෙනා ගුණය පාන් පෙත්තකින් නොලැබෙන බවට
සිහිකරමින් හුරු වෙමු රස ගුණ පිරි බත් පතට

පාන් කන්න කෝටි ගණන් මුදලක් පිට රටට
යවමින් අත දෙයි පිට රට ගොවියගේ යහ පතට
අපෙ හෙල ගොවියා ගැන සිහිපත් කරමින් සිතට
හුරු වෙමු අපිත් සිංහල හාලේ රස බත් පතට

ලැබෙනා වූ නිරෝගී භාවය ඔබගේ ගතට
ඒලෙසම සැලසෙන යහපත ගැන සිතමින් රටට
පාන් කන්න ගෙවන මුදල් අපෙ ගොවියගෙ අතට
ලැබ දීමට හුරු වෙමු අපි හෙල රස බත් පතට

බත් පතකින් ලැබෙන ගුණය පාන් වලින් අපට
කිසිවිටෙකත් නොලැබෙන බව සිහිකරමින් සිතට
නිරෝගී ජනතාවක් බිහිකරවන මෙන් රටට
හුරුවෙමු අපිත් සිංහල හාලේ රස බත් පතට

**ගොවිකම් සඟරාව රසවත් කළේ**

**එච්. ඒ. හෙන්ද්‍රික්**
**26/24, කුමුදුගම, දඩයම්තලාව, අම්පාර**